සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2024 ජනවාරි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

**(**Corporate & Personal Taxation**)**

2024-02-11
සෙනසුරාදා
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය)**:**

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත Build Experts (පෞද්ගලික) සමාගම** (BEL), ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක් කරගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමකි. එය, ඉන්දියාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇවැන්තයෙකු වන Build Tech **(ඉන්දියා)** (BTI), හි පරිපාලිත සමාගමකි. BEL, බොහෝ උපකරණ සහ උපාංග ඉන්දීය මව් සමාගමෙන් ලබාගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන් අනුව, 2022/23 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතුවලට අදාළව BEL හි වාසිකභාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) බදුකරණයේ මූලධර්ම හතරක්(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

(a) **ගිහාන්,** කොළඹ ජීවත් වන අතර, ඔහුට ගාල්ලේ අක්කර දෙකක ඉඩමක් තිබේ. ඔහු, එම ඉඩම 2015 අප්‍රේල් 01 දින රු. මිලියන 5 ක පිරිවැයක් දරමින් මිලට ගෙන තිබුණි. ඔහු මෙම ඉඩම 2022 දෙසැම්බර් මාසයේදී රු.200,000/- ක් තැරව්කාර ගාස්තු දරමින් රු. මිලියන 8 කට විකුණන ලදි. 2017 සැප්තැම්බර් 30 දිනට ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම රු. මිලියන 6.5 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මෙම ගනුදෙනුව මත **ගිහාන්** විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ මත බද්ද [(Capital Gain Tax) CGT] **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) අපනයනකරුවන් සඳහා ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු වන **සීමාසහිත සව්සිරි ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** අළුතෙන් පත්කළ වැටුප් ගණකාධිකාරී වන්නේ ඔබය. මෑතකදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වැටුප් ලියකියවිලි පරීක්ෂා කිරීම සඳහා සමාගම් පරිශ්‍රයට පැමිණියහ. පරීක්ෂාවෙන් පසු ඔවුහු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] සඳහා වන මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙස උපදෙස් දුන්හ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

APIT යෝජනා ක්‍රමය යටතේ සේවායෝජකයෙකුගේ වගකීම් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)
(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**නලින්** වෘත්තියෙන් නීතිඥවරයෙකි. දිනක් **නලින්ගේ** මිතුරෙකු ඔහු හමුවී ඔහුගේ අක්කර 50 ක කුරුඳු වත්ත රු. මිලියන 30 කට මිලට ගන්නා ලෙස පැවසුවේය. නලින් එය මිලට ගැනීමට කැමති වුවද, ඒ සඳහා ඔහුට ප්‍රමාණවත් මුදල් නොතිබුණි. කෙසේවෙතත්, එම වත්තෙන් 75% ක ප්‍රමාණයක් ලබාදීමේ එකගතාවය මත ඔහු අපේක්ෂිත ගැනුම්කරුවන්ගෙන් රු. මිලියන 20 ක් එකතුකර ගැනීමට සමත් විය.

**නලින්** මාස 2 ක් තුළ ගනුදෙනුව සම්පූර්ණ කිරීමට එකග වෙමින් රු. මිලියන 15 ක අත්තිකාරමක් ගෙවන ලදි. මාස දෙක අවසානයේදී ඔහු වත්ත මිලදීගෙන එයින් 75% ක ප්‍රමාණයක් කලින් මුදල් ලබාගත් ගැනුම්කරුවන්ට ලබා දුන්නේය. මුළු ඉඩමම මාස 6 ක කාලයක් තුළ විකිණීමට ඔහු සමත් විය. මෙම ගනුදෙනුවෙන් ඔහු රු. මිලියන 5 ක ශුද්ධ ලාභයක් ලැබීය.

ඔහු, මෙවැනි ස්වරූපයේ ගනුදෙනුවකට සම්බන්ධ වූ පළමු අවස්ථාව මෙය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මහවිතාරණ ට එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (Mahavithrana Vs CIR) නඩු තීන්දුවේ තීරණය සහ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන් පදනම් කර ගනිමින්, මෙම ගනුදෙනුවෙන් **නලින්** විසින් උපයන ලද ලාභය, බදු අරමුණු සඳහා සැලකිල්ලට ගත යුතුදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

(a) 2018 අංක 25 දරණ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් 2018 වර්ෂයේදී සංචාරකයින් සඳහා එකතු කළ අගය මත බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය [Tourist VAT Refund Scheme (TVRS)] හඳුන්වාදෙන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය සඳහා සුදුසුකම් ලැබීමට සංචාරකයෙකු විසින් සපුරාලිය යුතු නිර්ණායක දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **සීමාසහිත HP (පෞද්ගලික) සමාගම,** උපදේශන සේවා සැපයීමේ නිරත සමාගමකි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා එහි මුළු පිරිවැටුම රු.52,000,000/-.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා **සීමාසහිත HP (පෞද්ගලික) සමාගම** විසින් ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද [Social Security Contribution Levy (SSCL)] **ගණනය කරන්න.** (ලකුණු 03)
(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත Taste (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලාංකික රසකැවිලි නිෂ්පාදනය කර ඒවා දේශීය හා විදේශීය වෙළෙඳපොළේ විකිණීමේ නිරතව සිටියි. පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදි:

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ආදායම්වල විස්තර (එකතු කළ අගය මත බදු රහිතව):

| | රු. |
|---|---:|
| අපනයන | 6,692,000 |
| SVAT සඳහා ලියාපදිංචි පුද්ගලයින්ට කළ දේශීය විකුණුම් | 9,368,800 |
| අනෙකුත් දේශීය විකුණුම් | 17,399,200 |

(2) සමාගම විසින් කාර්තුව තුළදී පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | රු. |
|---|---:|
| ඇසුරුම් ද්‍රව්‍ය ආනයන මත | 845,000 |
| දේශීය ගැනුම් මත | 1,645,000 |
| කළමනාකරණ අධ්‍යක්ෂක විසින් භාවිත කරන මෝටර් රථය අළුත්වැඩියා කිරීම මත | 14,500 |

(3) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන ආ වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද (input VAT) රු.36,000/- කි.

(4) මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් සමාගම රු.50,000/- ක් ගෙවා තිබේ.

*(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 15% ක් ලෙස සළකන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**T & S දේපළ තක්සේරුකරුවෝ** යනු **තාරක** සහ **සුනිමල්** යන මිතුරන් විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි. **තාරක** ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන අතර, **සුනිමල්** ඉංජිනේරුවරයෙකි. ඔවුහු ව්‍යාපාරයේ ලාභා'ලාභ සමසමව බෙදාගැනීමට එකඟ වී සිටිති.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | රු. |
|---|---:|
| දළ ලාභය | 16,200,000 |
| වෙනත් ආදායම් - ස්ථාවර තැන්පතු මත පොළී ආදායම (දළ) | 3,400,000 |
| - කුලී ආදායම | 1,500,000 |
| අඩු කළා : පරිපාලන වියදම් | (13,500,000) |
| **හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය** | **7,600,000** |

- ඉහත ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකරගෙන තිබේ:

  (1) **තාරක** සහ **සුනිමල්** වර්ෂයකට පිළිවෙලින් රු.2,000,000/- ක් සහ රු.4,000,000/- ක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

  (2) වැටුපට අමතරව, වෘත්තිය ගාස්තු වශයෙන් මාසිකව රු.100,000/- ක් බැගින් ලැබීමට **සුනිමල්** හිමිකම් ලබයි.

  (3) ව්‍යාපාරයේ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරන **තාරකගේ** බිරිඳට මාසිකව රු.80,000/- ක් බැගින් ගෙවනු ලබයි.

  (4) පිළිකා රෝහලට රු.1,000,000/- ක මුදල් පරිත්‍යාගයක් සිදුකරන ලදී.

  (5) වර්ෂය තුළදී, රු.4,000,000/- ක පිරිවැයකට නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලට ගත් අතර, වර්ෂය සඳහා ක්ෂය වශයෙන් රු.400,000/- ක් පරිපාලන වියදම් යටතේ වාර්තාකර තිබුණි.

- ගොඩනැගිල්ලේ කොටසක් මාසයකට රු.125,000/- බැගින් වෙනත් සමාගමකට කුලියට දී තිබේ.

- පොලී ආදායම සහ කුලී ආදායම මත අත්තිකාරම් ආදායම් බදු [Advance Income Tax (AIT)] / රඳවා ගැනීමේ බදු [Withholding Tax (WHT] අඩුකර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ගෙවිය යුතු ආදායම් බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

**සීමාසහිත සුපර් (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් වන අතර, කඩදාසි අයිතම නිෂ්පාදන ව්‍යාපාරයක නිරතව සිටියි. ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශනය අනුව, සමාගම, 2022/23 තක්සේරු වර්ෂය සඳහා එහි ආදායම් බදු වගකීම රු.43,500,000/- ක් ලෙස ඇස්තමේන්තුගතකර ඇත. සමාගම පළමු වාරික දෙක වශයෙන් රු.20,000,000/- ක් ගෙවා තිබේ. තවද, අත්තිකාරම් ආදායම් බදු [Advance Income Tax (AIT)] / රඳවාගැනීමේ බදු [Withholding Tax (WHT)] රු.26,400/- ක් පළමු කාර්තු තුනේ පොලී ආදායම මත අඩුකරගෙන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2022/23 තක්සේරු වර්ෂය සඳහා තෙවන වාරිකය වශයෙන් ගෙවිය යුතු මුදල **තක්සේරු කරන්න.** (ලකුණු 03)

(b) 2022/23 තක්සේරු වර්ෂය සඳහා තෙවන වාරිකය ගෙවීමට නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) 2022/23 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ගොනු කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 02)

(d) සමාගම විසින් 2022/23 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව නියමිත දිනයට පෙර ගොනුකර ඇතැයි උපකල්පනය කරමින් 2022/23 තක්සේරු වර්ෂය සඳහා සංශෝධිත තක්සේරුවක් නිකුත් කිරීමට අදාල වන කාල කඩඉම් ප්‍රතිපාදන (time bar provisions) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ෆැෂන්ස් (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් වන අතර, නිමි ඇඳුම් ආනයනය කර දේශීය වෙළෙඳපොලේ විකිණීමේ නිරතව සිටියි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත ෆැෂන්ස් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන තිබේ:

*(2022/23 තක්සේරු වර්ෂයේදී හඳුන්වා දෙන ලද ආදායම් බදු සංශෝධන, කාලපරිච්ඡේදය නොසලකා සම්පූර්ණ තක්සේරු වර්ෂය සඳහාම අදාළ වන බව ඔබට සැළකිය හැකිය.)*

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සියලු වියදම් අයකිරීමෙන් පසු සහ සියලු ආදායම් බැර කිරීමෙන් පසු බදු පෙර ශුද්ධ ලාභය රු.64,250,000/- ක් විය. සමාගමේ මුළු පරිවැටුම රු.894,000,000/- ක් විය.

(2) වෙනත් ආදායම් විස්තර:

| | රු. |
|---|---:|
| මෝටර් රථයක් විකිණීමේ ලාභය | 216,000 |
| ලාභාංශ ආදායම - ලද ලාභාංශවලින් ප්‍රකාශ කළ | 650,000 |
| භාණ්ඩාගාර බිල්පත්වලින් ලද පොලී ආදායම | 400,000 |
| | **1,266,000** |

(3) පරිපාලන වියදම් හි පහත දෑ ඇතුලත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.4,860,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම රු.4,200,000/- කි.
- වර්ෂය තුළදී සමාගම, එහි අනාගත ගනුදෙනුකරුවන්ට සංග්‍රහ කිරීම සඳහා රු.320,000/- ක් වියදම් කර තිබේ.
- සේවක අර්ථසාධක අරමුදලට ප්‍රමාද වී ගෙවීම නිසා වූ දණ්ඩන වශයෙන් රු.136,000/- ක් ගෙවා තිබේ.
- විදේශීය සැපයුම්කරුවන් හමුවීම සඳහා අධ්‍යක්ෂකවරයාගේ විදේශ ගමන් වියදම් වශයෙන් රු.800,000/- ක් දරා තිබේ.

(4) බෙදාහැරීමේ වියදම් හි පහත දෑ ඇතුලත් වේ:

- දේශීය මාධ්‍යයන්හි ප්‍රචාරණ දැන්වීම් සඳහා රු.635,000/- ක් දරණ ලදී. නව ගබඩාවක් ඉදි කිරීම සඳහා සුදුසු ඉඩමක් සොයාගැනීම සඳහා පළකළ පුවත්පත් දැන්වීමේ පිරිවැය වූ රු.50,000/- ක් එහි ඇතුලත් වේ.
- සමාගම, රු.500,000/- ක් වටිනා නව ඇඟළුම්, ගංවතුරෙන් අනාථවූවන්ට පරිත්‍යාග කර තිබේ. තවද, ළමා නිවාසයක් පවත්වාගෙන යන අනුමත පුණ්‍යායතනයකට රු.600,000/- ක් පරිත්‍යාගකොට තිබේ.

(5) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| වත්කම් (පිරිවැය) | 2022.04.01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් / අත්පත් කර ගැනීම් (රු.) | ඉවත්කිරීම් (රු.) | 2023.03.31 දිනට ශේෂය (රු.) |
|---|---:|---:|---:|---:|
| මෝටර් ලොරි රථ | 26,900,000 | - | (2,600,000) | 24,300,000 |
| කාර්යාල උපකරණ | 2,150,000 | 460,000 | - | 2,610,000 |
| පරිගණක | 1,430,000 | - | - | 1,430,000 |
| පරිගණක මෘදුකාංග | - | 620,000 | - | 620,000 |
| **එකතුව** | **30,480,000** | **1,080,000** | **(2,600,000)** | **28,960,000** |

- 2019/20 තක්සේරු වර්ෂයේදී රු.2,600,000/- ක පිරිවැයකට මිලදී ගත් ලොරි රථයක් 2023 මාර්තු මාසයේදී රු.2,850,000/- කට විකුණන ලදී. මෙම ලොරි රථය භාණ්ඩ බෙදාහැරීම සඳහා භාවිත කරන ලදී.

- වර්ෂය තුළදී, සමාගම නව ගිණුම්කරණ පැකේජයක් මිලට ගත් අතර, එහි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 10 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.
- විශේෂයෙන් සඳහන් කර ඇත්නම් හැර, 2022 අප්‍රේල් 01 දිනට පැවති සියලු වත්කම් මිලදී ගන්නා ලද්දේ 2019/20 තක්සේරු වර්ෂයේදීය.

(6) පහත දැක්වෙන වෙනත් තොරතුරු ද සපයා තිබේ:

- වර්ෂය තුළදී විශ්‍රාම ගත් සේවකයෙකුට පාරිතෝෂික වශයෙන් රු.625,000/- ක් ගෙවා තිබේ.
- සමාගම 2022/23 තක්සේරු වර්ෂයේ කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.10,000,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා **ෆැෂන්ස් (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද / (වැඩිපුර ගෙවූ බද්ද).

*(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුය.)* (ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

**සැලී, සීමාසහිත කලම්බු ඉංග්ලිෂ් ඇකඩමි (පෞද්ගලික) සමාගමේ** (මින්පසු සමාගම යැයි හැඳින්වෙන) පූර්ණකාලීන ඉංග්‍රීසි ගුරුවරියක ලෙස සේවය කරයි.

2022/23 තක්සේරු වර්ෂයට (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) අදාලව **සැලීගේ** ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

*(2022/23 තක්සේරු වර්ෂය තුළදී හඳුන්වාදෙන ලද ආදායම් බදු සංශෝධන, කාලපරිච්ඡේදය නොසළකා සම්පූර්ණ තක්සේරු වර්ෂය සඳහාම අදාල වන බව ඔබට සැලකිය හැක්ය.)*

(1) සේවා නියුක්තියෙන් ලද ආදායම:

- සමාගමෙන් ලැබුණු දළ වැටුප මාසයකට රු.180,000/- බැගින් විය.
- සමාගම, සියලු සේවකයින්ට පුද්ගලික වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ලබාදී තිබේ. 2022 දෙසැම්බර් මාසයේදී සමාගම විසින් **සැලී** වෙනුවෙන් වාර්ෂික වාරිකය ලෙස රු.96,000/- ක මුදලක ගෙවා තිබේ.
- **සැලී** වාසය කරන්නේ සමාගම විසින් ලබා දී ඇති මහල් නිවාසයක වන අතර, එයට සමාගම මාසිකව රු.45,000/- ක් බැගින් ගෙවනු ලබයි. සමාගම විසින් සපයා ඇති වාසස්ථානය වෙනුවෙන් **සැලීගේ** වැටුපෙන් මාසිකව රු.10,000/- බැගින් අඩුකරනු ලබයි.
- ඉන්ධන දීමනාව මාසයකට රු.40,000/- ක් බැගින් විය.
- 2022 නොවැම්බර් මාසයේදී, සමාගම නියෝජනය කරමින් සමුළුවක් සඳහා ඇයව ජර්මනියට යවන ලද අතර, ගුවන් ටිකට්පත් සහ නවාතැන් පිරිවැය ලෙස රු.500,000/- ක් සමාගම මගින් දරණ ලදී.
- වර්ෂය සඳහා අඩුකරන ලද අත්තිකාරම් පුද්ගල බද්ද [Advance Personal Income Tax (APIT)] රු.266,400/- කි.

(2) සැලී, සෑම සති අන්තයකදීම 10 ශ්‍රේණියේ සිසුන් සඳහා උපකාරක පන්තියක් පවත්වන අතර, වර්ෂය සඳහා එහි ආදායම් විස්තර පහත දැක්වේ:

| විස්තරය | රු. | රු. |
|---|---|---|
| උපකාරක පංති ආදායම |  | 3,600,000 |
| **අඩුකලා : ගෙවීම්** |  |  |
| සේවක වැටුප් | 600,000 |  |
| නිබන්ධන සඳහා පිරිවැය | 1,680,000 |  |
| දුරකතන ගාස්තු (20% ක් ඇයගේ පුද්ගලික ඇමතුම් ගාස්තු වේ) | 150,000 |  |
| ක්ෂයවීම් | 100,000 | (2,530,000) |
| **ශුද්ධ ලාභය** |  | **1,070,000** |

2021/22 තක්සේරු වර්ෂයේදී රු.750,000/- ක පිරිවැයකට මිලදීගත් ගෘහ භාණ්ඩ සඳහා ඉහත ක්ෂය අයකර තිබේ.

(3) වර්ෂය තුළදී, සැලීට පහත සඳහන් පොලී ආදායම් ලැබී තිබේ:

| විස්තරය | ලැබුණු දිනය | මුදල (දළ) (රු.) | අඩු කළ AIT / WHT (රු.) |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතුව මත පොලය | 2023.02.02 | 500,000 | 25,000 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 2023.03.01 | 700,000 | - |

(4) ලාභාංශ ආදායම සහ කොටස් විකිණීමෙන් ළද ලාභ:

- 2022 දෙසැම්බර් මාසයේදී සැලී විසින් ලැයිස්තුගත සමාගම්වල කොටස් විකිණීමෙන් රු.200,000/- ක ලාභයක් උපයා ඇත.
- 2023 මාර්තු මාසයේදී ලැයිස්තුගත සමාගම්වලින් ලැබුණු ලාභාංශ ආදායම (ලැබුණු ලාභාංශවලින් ගෙවූ) රු.300,000/- කි.

(5) 2022 ජූලි මාසයේදී, ඇය රු.400,000/- ක් වටිනා වෛද්‍ය උපකරණ, කොළඹ විශ්ව විද්‍යාලයේ 'වෛද්‍ය පීඨයට' පරිත්‍යාග කර තිබේ.

(6) ඇය, 2022/23 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු ගෙවීම් වශයෙන් රු.350,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා **සැලීගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

*(සැ.යු: යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුය.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |